## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# නාගරික සංවර්ධන අධිකාරිය (UDA)

# පුරප්පාඩු

පහත සඳහන් තනතුරේ පවතින පුරප්පාඩුව සඳහා යථායෝග්‍ය පරිදි සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් හට පහත දැක්වෙන සුදුසුකම් හා පළපුරුද්ද තිබිය යුතුය.

## නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල් (මූල්‍ය)

01. **සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන ගණකාධිකරණය / කළමනාකරණය/ වාණිජ්‍යය / ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් (ශාස්ත්‍රපති/ විද්‍යාපති) හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක, පිළිගත් වෘත්තීයවේදී වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකරණ මට්ටමේ" අවම වශයෙන් වසර 18 ක පළපුරුද්ද.

වැටුප් පරිමාණය : ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටම - HM 1-3

2016.10.21 දනම හා අංක 02/2016(i) දරන කළමනාකරණ සේවා චක්‍ර ලේඛය හි ප්‍රතිපාදනයන්ට යටත්ව 2020.01.01 දිනට අදාළ වැටුප සමග අධිකාරිය විසින් නඩත්තු කරනු ලබන රථ වාහනයක්

02. පොදු කොන්දේසි :

(අ) අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩු අය විය යුතුය. රාජ්‍ය අංශයේ/ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු අපේක්ෂකයින් හට මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.

(ආ) පත්වීම ස්ථිර සේවා පදනම මත වනු ඇත.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල (EPF) (අධිකාරිය විසින් 15%ක දායකත්වය)

(ඈ) සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල (ETF) (අධිකාරිය විසින් 3%ක දායකත්වය)

03. ආන්තික ප්‍රතිලාභ

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) හි නිවාස ණය හා ආපදා ණය (Distress Loan) යෝජනා ක්‍රමය

(ආ) වාර්ෂික ප්‍රසාද දීමනාව (Bonus)

(ඇ) වෛද්‍ය රක්ෂණය

04. තෝරාගනු ලබන අපේක්ෂකයින් ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත වැටුප් පරිමාණයේ මූලික තලයට ඉහළ වැටුප් තලයක පිහිටුවීම කෙරෙහි සලකා බලනු ලැබේ.

05. අයදුම්කරුවන් විසින් සිය අධ්‍යාපන වෘත්තීයවේදී සුදුසුකම් හා පළපුරුද්ද සහිතව ස්වකීය ජීවදත්ත තොරතුරු ප්‍රකාශ (CV) ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සමග **2022 අගෝස්තු මස 10 වන දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කරුණාකර අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරන්න.

06. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතු වන අතර, කලට වේලාවට එම අයදුම්පත් ලැබෙන බව තහවුරු කර ගැනීම සඳහා සෘජු පිටපතක්ද කලින් එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය (UDA),**
**09 වන මහල, "සෙත්සිරිපාය",**
**බත්තරමුල්ල.**